# සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

ගුවන් සමාගම් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක

**(PB 67)**

**රැස්වීම දැනුම් දීම**

පහත දැක්වෙන අරමුණු අරබයා, **සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අති විශේෂ මහ සභා රැස්වීමක්,** අන්තර්ජාලගතව සිදු කෙරෙන රැස්වීමක් ලෙස, 2024 ජුනි මස 25 වන අගහරුවාදා දින ප.ව. 3.00 ට සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ සිට ප්‍රභවය වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ **:-**

<u>**න්‍යාය පත්‍රය**</u>

**1.** පහත දැක්වෙන යෝජනාව, යෝග්‍යවේයැයි හඟින්නේ නම්, **සාමාන්‍ය යෝජනාවක්** ලෙස සම්මත කර ගැනීම සලකා බැලීම

ශ්‍රී ලංකා රුපියල් බිලියන 5 ක් වූ ප්‍රමාණයේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන නික්ෂේපණයක් ලැබීම හඳුනා ගැනීම අනුව, එක් කොටසක මිල ශ්‍රී ලංකා රුපියල් 100 ගණනේ නව සාමාන්‍ය කොටස් මිලියන 50 ක් වූ ප්‍රමාණයක් ඇති කිරීම මගින් සහ නව සාමාන්‍ය කොටස්, ශ්‍රී ලංකා රජය වෙත වෙන්කර දීම මගින් මගින්, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය, ශ්‍රී ලංකා රුපියල් 198,860,665,500 සිට ශ්‍රී ලංකා රුපියල් 203,860,665,500 දක්වා ඉහළ නැංවිය යුතු බවටත්, ඉහළ නංවනු ලබන බවටත් **මෙයින් යෝජනා කරනු ලැබේ.**

**2.** පහත දැක්වෙන යෝජනාව, යෝග්‍යවේයැයි හඟින්නේ නම්, **විශේෂ යෝජනාවක්** ලෙස සම්මත කර ගැනීම සලකා බැලීම

'ලිඛිතව' හෝ 'ලිඛිත', 'කොටස් හිමියා' යන වචන අර්ථ නිරූපණයට ඇතුළත් කිරීම මගින් ද, 'සාමාජිකයා' යන වචනයේ අර්ථ නිරූපණය ආදේශ කිරීම මගින් ද, දැනට පවත්නා 52, 54 සහ 155-161 යන වගන්ති කපා හැර ඉවත් කිරීම මගින් ද, මෙහි යට දැක්වෙන 52, 54 සහ 155-161 යන වගන්ති ආදේශ කිරීම මගින් ද, සමාගම විසින් ස්වකීය සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කළ යුතු යැයි **මෙයින් යෝජනා කරනු ලැබේ**.

| | |
|---|---|
| 'ලිඛිතව' හෝ 'ලිඛිත' | වදන්, දෘශ්‍ය ස්වරූපයකින් මුද්‍රණය කිරීම සහ ඒවා ප්‍රතිනියෝජනය කිරීමේ හෝ ප්‍රතිනිර්මාණය කිරීමේ වෙනත් එවැනි ක්‍රම ඇතුළත් වේ; |
| 'සාමාජිකයා' | තත් කාලයේ සමාගමට අයත් යම් කොටස් හිමියෙකු අදහස් කරයි; |
| 'කොටස් හිමියා' | පනතෙහි දක්වා ඇති අර්ථයම තිබිය යුතු වන්නේ ය; |

## මහා සභා රැස්වීමේ දැන්වීම

දැනුම්දීම

කෙටි දැනුම්දීම

52. සමාගම විසින් සමාගමේ සාමාජිකයින් වෙත මෙම ලේඛනය මගින් දෙනු ලැබිය යුතු යෝජනාවක් පිළිබඳව වූ විශේෂ දැනුම් දීමක (පනත මගින් විධිවිධාන සලසා ඇති ආකාරයට හැර) හෝ දැනුම් දීමක් සම්මත කර ගනු පිණිස යෝජනා කරනු ලබන මහා සභා රැස්වීමක් වැඩ කරන දින දහයක් තුළ ලිඛිතව ඉදිරිපත් කරනු ලැබීම මගින් කැඳවිය යුතු වන්නේ ය; සහ වෙනත් යම් මහා සභා රැස්වීමක් (වාර්ෂික මහා සභා රැස්වීමක් හැර) සම්බන්ධයෙන් නම්, වැඩ කරන දින දහයක් තුළ ලිඛිතව ඉදිරිපත් කරනු ලබන දැනුම්දීමක් (එය ලබා දෙන හෝ ලබා දෙතැයි සලකනු ලබන දිනය සහ එය ලබා දෙන දිනය යන එක් එක් කරුණට සීමා වූ) මගින් සහ වාර්ෂික මහා සභා රැස්වීමක් සම්බන්ධයෙන් නම්, වැඩකරන දින පහළොවක් තුළ ලිඛිතව ඉදිරිපත් කරනු ලබන දැනුම් දීමක් මෙම ලේඛනය ප්‍රකාරව එකී දැනුම් දීම ලැබීමට හිමිකම ඇති සාමාජිකයන් වෙත ද, විගණකවරුන් වෙත ද, මෙම ලේඛනයෙහි සඳහන් කර ඇති පරිදි දෙනු ලැබිය යුතු වන්නේ ය. එතෙකුදු වුවත්, එය සිදුවිය යුත්තේ, යම් මහා සභා රැස්වීමක් සම්බන්ධයෙන් නම්, ඉහත නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට වඩා කෙටි කාල සීමාවක දැනුම් දීමක් මගින් එම රැස්වීම කැඳවා තිබීම නොසලකා, එම රැස්වීම, ඒ අනුව නිසි පරිදි පහත කරුණුවලට යටත්ව කැඳවා ඇති බවට එකඟ වන්නේ නම් පමණි:

(i) එය, වාර්ෂික මහා සභා රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, ඊට පැමිණීමට හා එම රැස්වීමේ දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ලබන සියලුම කොටස් හිමිකරුවන් විසින්; සහ

(ii) එය, වෙනත් මහා සභා රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, පනත මගින් නියමක් කර ඇති පරිදි, ඊට පැමිණීමට හා එම රැස්වීමේදී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ලබන සාමාජිකයන්ගේ සාකල්‍ය සංඛ්‍යාව හෝ බහුතර සංඛ්‍යාව විසින්; කැඳවනු ලැබ ඇතැයි සැලකිය යුතු වන්නේ ය.

**දැනුම්දීමේ අන්තර්ගතය**

54. මහා සභා රැස්වීමක් කැඳවන සෑම දැනුම් දීමක ම, රැස්වීම පවත්වන ස්ථානය සහ දිනය සහ වේලාව සඳහන් කළ යුතු අතර, එම ස්ථානය යන්නට ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සන්නිවේදනය හරහා අතථ්‍ය / මාර්ගගත අවකාශයක් ඇතුළත් වන්නේ ය; සහ එවැනි සෑම දැනුම් දීමකම, සාධාරණ ප්‍රමුඛතාවයකින් යුතු ප්‍රකාශයක් මගින් එසේ ඊට සහභාගී වීම සඳහා හිමිකම් ඇති සාමාජිකයනකුට, තමා වෙනුවෙන් අදාළ රැස්වීමට සහභාගී වීමට සහ එහි දී ඡන්දය දීමට පෙරකලාසිකරුවකු පත් කරනු ලැබීමට අයිතියක් ඇතැයි යනුවෙන් ද, එකී පෙරකලාසිකාරත්වය දරන්නා සාමාජිකයෙකු වීම අවශ්‍ය වන්නේ නැතැයි යනුවෙන් ද පෙන්නුම් කර සිටිය යුතු වන්නේ ය.

## දැනුම්දීම

155. සමාගමට සාමාජිකයින් වෙත කිසියම් ලේඛනයක් යැවීමට හෝ කිසියම් කරුණක් පිළිබඳව දැනුම් දීමට අවශ්‍ය වූ විට, එවැනි සාමාජිකයෙකුගේ අවසන් වරට දන්නා විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ ලියාපදිංචි ලිපිනයට අදාළ ලේඛනය හෝ දැනුම් දීම සාමාන්‍ය තැපෑලෙන් යැවීම, සමාගම විෂයයෙහි ප්‍රමාණවත් වන්නේ ය. සමාගමේ වෙබ් අඩවියෙහි හෝ වෙනත් අතථ්‍ය අන්තර්ජාල ද්වාරයක අදාළ ලේඛනය හෝ දැනුම් දීම පළ කර ඇති අවස්ථාවක, එම දැනුම් දීම ද, සමාගම විසින්, පුවත්පත් හරහා මහජන දැනුම් දීමක් මගින් දැනුම් දෙනු ලැබිය හැකි පරිද්දෙන් වූ දැනුම් දීමක් ලෙස සලකනු ලබනවා ඇත. සාමාන්‍ය තැපෑලෙන් යවන ඕනෑම ලේඛනයක් හෝ දැනුම් දීමක්, අදාළ ලේඛනය හෝ දැනුම් දීම ඇතුළත් කෙරුනු නිසි ලෙස ආමන්ත්‍රණය කරන ලද සහ පෙර ගෙවුම් කරන ලද ලිපියක් සාමාජිකයා වෙත වැඩ කරන දින තුනක් (03) ක් ඇතුළත ලැබුණා සේ සැලකෙනු ඇති අතර, විද්‍යුත් තැපෑල හෝ වෙනත් මාර්ගගත සන්නිවේදනයක් මගින් යවන ලද කිසියම් දෙයක්, එය, ඔහුගේ අවසන් වරට දන්නා විද්‍යුත් තැපැල් ලිපිනය කරා යැවීමෙන් පසුව හෝ අදාළ දැනුම් දීම, සමාගමේ වෙබ් අඩවියෙහි හෝ වෙනත් අතථ්‍ය අන්තර්ජාල ද්වාරයක පළ කරන අවස්ථාවේ දීම, යථා යෝග්‍ය පරිදි, සාමාජිකයා වෙත ලැබුණු බවට සැලකේ.

**විදේශවල පදිංචි සාමාජිකයන්ට ශ්‍රී ලංකාව තුළ ලිපිනයක් දැනුම් දීමට හැකි බව.**

156. ස්වකීය ලියා පදිංචි ලිපිනය ශ්‍රී ලංකාවෙන් බැහැරව පිහිටි යම් සාමාජිකයෙකුට ශ්‍රී ලංකාව තුළ යම් ලිපිනයක් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයක් සමාගම වෙත ලිඛිතව දැන්වීමට හැකි වන අතර දැනුම් දීම් යැවීමේ කාර්යය සඳහා එම ලිපින කිසිවක්, යථා යෝග්‍ය පරිදි, ඔහුගේ ලියා පදිංචි ලිපිනය ලෙස සැලකිය යුතු වන්නේ ය.

**බද්ධ හිමිකම සම්බන්ධයෙන් දැනුම්දීම් යැවීම**

157. යම් බද්ධ හිමිකමක් සම්බන්ධයෙන් වන සියලු දැනුම් දීම, සාමාජිකයන්ගේ කොටස් රෙජිස්ටරයෙහි පළමුව නම සඳහන් අදාළ කොටස් හිමියන්ගෙන් එක් තැනැත්තෙකු වෙත කරනු ලබන අතර එසේ කරනු ලබන දැනුම් දීම, යථා යෝග්‍ය පරිදි, සියලු බද්ධ හිමිකරුවන් වෙත කරනු ලබන ප්‍රමාණවත් දැනුම් දීමක් වන්නේ ය.

**සාමාජිකයකුගේ මරණයෙන් හෝ වස්තු භංගත්වයට පත්වීමෙන් පසුව දැනුම්දීම් යැවීම**

158. සාමාජිකයෙකුගේ මරණයේ හෝ වස්තු භංගත්වයේ ප්‍රතිඵලයක් ලෙස යම් කොටසකට හිමිකම් ඇති තැනැත්තෙකු වෙතින් එම කොටසට ඔහුගේ හිමිකම පෙන්වන ලෙස සමාගම විසින් යුක්ති සහගතව ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් සාක්ෂි සමාගමට සැපයීමෙන් පසුව සහ යම් දැනුම් දීම් යවනු ලැබීම සඳහා ශ්‍රී ලංකාව තුළ ලිපිනයක් ද එම තැනැත්තා විසින් සැපයීමෙන් පසුව, එවැනි ලිපිනයකට හෝ කිසියම් විද්‍යුත් මාධ්‍යයක් හරහා සාමාජිකයා වෙත ඔහුගේ මරණය හෝ වස්තු භංගත්වය නොවන්නට ඔහු වෙත යවනු ලැබීමට ඔහුට හිමිකම් තිබූ යම් ලිපිනයක් හෝ විද්‍යුත් මාධ්‍යයක් හරහා ඒ වෙත යම් දැනුම් දීමක් හෝ ලේඛනයක් එම තැනැත්තා වෙත යවනු ලැබීම සඳහා ඒ තැනැත්තාට හිමිකම් ලැබෙන අතර, එම සේවා කිරීම, කොටස් සම්බන්ධයෙන් අභිලාෂයක් දක්වන (ඔහු සමඟ බද්ධව හෝ ඔහු මගින් හෝ ඔහු යටතේ හිමිකම් පෑම යන කවර අයුරකින් වුව ද) සියලුම තැනැත්තන්ට අදාළ සෑම කාර්යයක් සඳහා ම එවැනි යම් දැනුම් දීමක් හෝ ලේඛනයක් යැවීම, ප්‍රමාණවත් සේවා කිරීමක් සේ සැලකේ. යථෝක්ත ආකාරයෙන් හැරුණු විට, මෙම ලේඛනය ප්‍රකාරව, යම් සාමාජිකයෙකුගේ ලියාපදිංචි ලිපිනයට තැපෑලෙන් හෝ යම් විද්‍යුත් මාධ්‍යයක් හරහා භාරදෙන ලද හෝ යවන ලද හෝ ඔහුගේ ලියාපදිංචි ලිපිනයෙහි තබා එන ලද කිසියම් දැනුම් දීමක් හෝ ලේඛනයක්, එම සාමාජිකයා ඒ වන විට මිය ගොස් හෝ වස්තු භංගත්වය ලබා සිටියේ ද සහ සමාගම ඔහුගේ මරණය හෝ වස්තු භංගත්වය පිළිබඳව දැනුවත්ව සිටියේ ද, නොසිටියේ ද යන්න නොසලකා ඊට අදාළ දැනුම් දීම, තනි හෝ බද්ධ හිමිකරු වශයෙන් අදාළ සාමාජිකයාගේ නමින් ලියාපදිංචි කර ඇති යම් කොටසක් සම්බන්ධයෙන් එකී සාමාජිකයා වෙත නියමිත පරිදි දන්වා යවනු ලැබ ඇතැයි සැලකේ.

**ලියාපදිංචි ලිපිනයක් නොමැති සාමාජිකන් වෙත කෙරෙන දැනුම්දීම**

159. සාමාජිකයෙකු, ඔහුට යම් දැනුම් දීම් කිසිවක් කිරීම සඳහා සමාගම වෙත ඔහුගේ ලියාපදිංචි ලිපිනයක් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයක් සපයා නොමැති නම්, සමාගමේ වෙබ් අඩවියෙහි හෝ වෙනත් අන්තර්ජාලගත අතථ්‍ය ද්වාරයක, යථා යෝග්‍ය පරිදි, පළ කර ඇති දැනුම් දීමක්, ඔහු වෙත නිසි පරිදි කරනු ලැබ ඇති දැනුම් දීමක් ලෙස සැලකිය යුතු වන්නේ ය.

**දැන්වීමක් මගින් දැනුම්දීම**

160. සමාගම විසින් සාමාජිකයින් වෙත කරනු ලැබිය යුතු යම් දැනුම් දීමක්, දැන්වීමක් මගින් ලබා දෙන්නේ නම්, එය ප්‍රමාණවත් පරිදි ලබා දිය යුතු වන්නේ ය.

දැන්වීමක් මගින් දැනුම්දීම් කිරීමේ ක්‍රමය

161. පනත මගින් වෙනත් ආකාරයකින් නියම කරනු ලැබ ඇතොත් මිස, දැන්වීමක් මගින් දැනුම්දීමක් කිරීම අවශ්‍ය වන්නා වූ හෝ දැනුම් දීමක් කරනු ලැබිය යුතු වන්නා වූ යම්කිසි දැනුම් දීමක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පළ වන යම් ප්‍රමුඛ ජාතික දිනපතා පුවත්පත් කිසිවක එක් වරක් ප්‍රචාරය කළ යුතු වන්නේ ය.

සැකයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි ඇති ඉතිරි වගන්ති සහ උප වගන්ති, යථා යෝග්‍ය පරිදි, නොවෙනස්ව පැවතිය යුතු වන්නේ ය.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**
**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම**

Sgd.
**ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
**ආයතනික ලේකම් සේවාවන්හී සමූහ ප්‍රධානී / සමාග ලේකම්**

**2024** මැයි මස **17** වන දින දීය.

**සටහන :**

1. අන්තර්ජාලගත ලෙස අතථ්‍යව පවත්වනු ලබන **අති විශේෂ මහ සභා රැස්වීමට** සහභාගී වීම සඳහා හිමිකම් ඇති සාමාජිකයෙකුට, තමා වෙනුවෙන් අදාළ රැස්වීමට සහභාගී වීමට සහ එහි දී ඡන්දය දීමට පෙරකලාසිකරුවකු පත් කරනු ලැබීමට අයිතියක් ඇත. එකී පෙරකලාසිකාරත්වය දරන්නා සාමාජිකයෙකු වීම අවශ්‍ය වන්නේ නැත.

2. වලංගුභාවය ලබනු පිණිස, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය, අති විශේෂ මහ සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට පෙර,

   2.1 සමාගම් ලේකම් කාර්යාලය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, "ගුවන් සමාගම්" මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක යන ලිපිනය වෙත තැපෑලෙන් හෝ අතින් ගෙනවුත් භාර දිය යුතු ය.
   **එසේ නැතහොත්,**

   2.2 පරිලෝකනය කරන ලද පෙරකලාසි පත්‍රය, **comsec@srilakan.com** යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ එවිය යුතු ය.

සටහන
මෙම ලේඛණය ඉංග්‍රීසි ලේඛණයේ පරිවර්තනයක් වන අතර, පරිවර්තන ගැටලු පවතින සෑමවිටම ඉංග්‍රීසි ලේඛණය පරිශීලනය කරන්න.